# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2390/08 - 2024 ජූනි මස 25 වැනි අඟහරුවාදා - 2024.06.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

ඉමදූව ප්‍රාදේශීය සභාව

**1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනත**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු (267 වන අධිකාරය වන) 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ඉමදූව ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2023.10.04 දින අංක 150 යටතේ ගෙන ඇති පහත සඳහන් තීරණයට 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (2) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව දකුණු පළාතේ, ආණ්ඩුකාරවර විලියම් විජේසිංහ ගමගේ වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආචාර්ය **විලියම් විජේසිංහ ගමගේ,**
දකුණු පළාත් ආණ්ඩුකාරවර.

2024 පෙබරවාරි මස 16 වැනි දින,
ගාල්ල, ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

*තීරණය*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9 (3) වගන්තිය සමග කියවිය යුතු (267 වන අධිකාරය වන) 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ඉමදූව ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ඉමදූව ප්‍රාදේශීය සභාව, සභාවේ පරිපාලන සීමාව ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන ඉහත කී විනෝද බදු ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට කරනු ලබන ගෙවීමකින් 15% (සියයට පහළවක) ට සමාන මුදලක්, බද්දක් වශයෙන් පනවා අය කිරීමටත්, මෙම තීරණය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක විය යුතු බවත් තීරණය කරමි. තවද ඉහත පනවන ලද විනෝද බද්ද, එකී විනෝද කාර්යය පවත්වන දිනට පෙර අදාළ සංවිධායක හෝ සංවිධායකවරුන් විසින් නිසි ලෙස ඉමදූව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටද තීරණය කරමි.

EOG 06 - 0170


1A - PG 6755 — 07 (2024/06)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*